# මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ගැලපිලි

ව්‍යාපාරයක් කාල පරිච්ඡේදයක් තුල දී ව්‍යාපාර කටයුතු වලින් ලද ප්‍රතිඵල, මූල්‍ය තත්වය අවබෝධ කර ගැනීම සඳහා සාමාන්‍යයෙන් සකස් කරන මූල්‍ය ප්‍රකාශ පහත දැක්වේ.

01. ආදායම් ප්‍රකාශය - **නිශ්චිත කාලපරිච්ඡේදයක්** තුල ව්‍යාපාර කටයුතු වලින් ලද **ලාභය හෝ අලාභය** එනම් ලාභදායිත්වය අවබෝධ කර ගැනීමට පිළියෙල කරන ප්‍රකාශයයි.

02. ශේෂ පත්‍රය - කිසියම් **කාල පරිච්ඡේදයක් අවසාන වන දිනට** ව්‍යාපාරයක පවතින **වත්කම්, වගකීම් හා ප්‍රාග්ධනය** පෙන්නුම් කරන එනම් **මූල්‍යතත්වය පෙන්නුම් කරන** ප්‍රකාශයයි.

03. මුදල් ප්‍රවාහ ප්‍රකාශය - කිසියම් **කලපරිච්ඡේදයක් තුල මුදල්, මුදල් හා ඒ සමාන වෙනත් දෑ ලැබීම් හා යෙදවීම්** නිරූපණය කරන ප්‍රකාශයන් ය.

04. ස්කන්ධ වෙනස් වීම් ප්‍රකාශය - වර්ෂයක **කාල පරිච්ඡේදයක් සඳහා අයිතිකරුවන්ගේ හිමිකමේ ඇති වූ** වෙනස් වීම් පෙන්වන ප්‍රකාශයයි.

05. ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් - **ඉහත ප්‍රකාශ තුලින් අනාවරණය නොවන නමුත් අනාවරණය කළ යුතු ගණුදෙණු හා තොරතුරු සටහන් කිරීමයි.**



# ගැලපිලි සටහන්

ගිණුම් කලපරිච්චේදය තුල සෑම ගණුදෙනුවක්ම පොත් වල සටහන් නොවී තිබිය හැක.එම නිසා කලපරිච්චේදය තුල සටහන් නොවූ ගණුදෙනු අවසාන ගිණුම් වලට ඇතුලත් කිරීම සඳහා පොදු ජනලයේ තබන්නා වූ සටහන් ගැලපීම් සටහන් ය. ව්‍යාපාර වල ගිණුම් කලපරිච්චේදය අවසානයේ බහුලව තබන ගැලපිලි සටහන් පහත අයුරින් වර්ග කල හැකිය.

**<u>01.අවසන් තොගය ගැලපීම.</u>**

කිසියම් ගිණුම් කලපරිච්චේදයක් අවසන් වන විට ව්‍යාපාරයක ඉතිරිව ඇති නැවත විකිණීමේ පරමාර්ථයෙන් අත්පත් කරගත් තොග වෙළද ගිණුම තුලින් පහත පරිදි ගැලපිය යුතුය.

**අවසාන තොග ගිණුම හර**

**වෙළද ගිණුම බැර**

මෙහි දී "අවසාන තොග ගිණුම හර" යන්න ශේෂ පත්‍රය තුල ජංගම වත්කම් තුලත් "වෙළද ගිණුම බැර" යන්න යන්න වෙළද ගිණුමේ හර පැත්තෙන් අඩු කිරීමක් ලෙසත් දැක්විය යුතුය.

- 2016.12.31 දිනෙන් අවසන් වර්ෂයේ පොත්වලින් පහත දෑ උපුටා ගන්නා ලදි.

| | නිමි ඒකක | ඒකකයක ගැනුම් මිල | මුළු ගැනුම් මිල | ඒකකයක විකුණුම් මිල | විකුණුම් මිල |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| 2010.01.01 දිනට තොගය | 600 | *10 | 6,000 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ගැනුම් | 60,000 | *10 | 600,000 | | |
| | 60,600 | *10 | 606,000 | | |
| විකුණුම් | 50,000 | | | *16 | 800,000 |

අවශ්‍ය වන්නේ,

1) ව්‍යාපාරයේ 2016.12.31 දිනට ඉතිරි තොගයේ අගය ගණනය කරන්න.

2) ව්‍යාපාරයේ දල ලාභය ගණනය කරන්න.

3) 2016.12.31 දිනෙන් අවසන් වර්ෂයේ වෙළඳ ගිණුම පිළියෙල කරන්න.

4) 2016.12.31 දිනට ඉතිරි තොගය ගැලපීමට අදාල ජර්නල් සටහන දක්වන්න.

- 2016.12.31 දිනට සුකී ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත දෑ උපුටා ගන්නා ලදී.

| | රු. | රු. |
|---|---|---|
| මුල් තොගය | 20,000 | |
| ගැනුම් | 600,000 | |
| ගෙන ඒමේ කුලී | 30,000 | |
| විකුණුම් | | 850,000 |

2016.12.31 දිනට නොවිකිණි ඉතිරි වී ඇති තොගය රු.50,000 කි.

අවශ්‍ය වන්නේ,

1) ඉතිරි තොගය ගැලපීමට අදාල ජර්නල් සටහන දක්වන්න.

2) 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වල උදාහරණ පෙන්නුම් කරන්න.

## 02. උපචිත වියදම් ගැලපීම.

ගිණුම් කලපරිච්ඡේදය අවසාන වන විට තවදුරටත් ගෙවීමට ඇති කලපරිච්ඡේදයට අදාල වියදම් පහත පරිදි ගැලපිය යුතුය.

**අදාල වියදම් ගිණුම හර**

**උපචිත වියදම් ගිණුම බැර**

මෙහිදී "අදාල වියදම් ගිණුම හර" යන්න අදාල වියදම් ගිණුමට එකතු වී ලාභාලාභ ගිණුමට හර වේ. එසේම "උපචිත වියදම් ගිණුම බැර" යන්න ශේෂ පත්‍රයේ ජංගම වගකීම් වල සටහන් කෙරේ.

- 2016.12.31 දිනට සතු ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත දෑ උපුටා ගන්න ලදි.

| | රු. | රු. |
|---|---|---|
| වරිපනම් | 20,000 | |
| විදුලිය | 33,000 | |
| ප්‍රචාරන ගාස්තු | 66,000 | |

අතිරේක තොරතුරු

1) 2016 වර්ෂය සඳහා මාසිකව ගෙවිය යුතු වරිපනම් මුදල රු.2,000 කි.

2) 2016.12.31 දිනට ගෙවිය යුතු විදුලි බිල රු.3,000 කි.

3) 2016 වර්ෂයේ ප්‍රචාරන ගාස්තු ගෙවන ලද්දේ මාස 11 කට පමණි.

අවශ්‍ය වන්නේ,

1) ඉහත ගැලපිලි ගැලපීමට අදාල ජර්නල් සටහන් දක්වන්න.

2) 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුමේ හා 2016.12.31 දිනට ශේෂ පත්‍ර උද්ධෘතයන් පිළියෙල කරන්න.

## <u>03. ලැබිය යුතු ආදායම් ගිණුම.</u>

ගිණුම් කලපරිච්චේදය අවසාන වන විට තවදුරටත් ලැබීමට ඇති කලපරිච්චේදයට අදාල වියදම් පහත පරිදි ගැලපිය යුතුය.

**ලැබිය යුතු අදායම් ගිණුම හර**

**අදාල අදායම් ගිණුම බැර**

මෙහිදී "ලැබිය යුතු අදායම් ගිණුම හර " යන්න ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙසත් අදාල "අදායම් ගිණුම බැර" යන්න අදාල අදායම් ගිණුමට එකතු වී ලාභාලාභ ගිණුම බැර වේ.

- 2016.12.31 දිනට රාජ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත දෑ උපුටා ගන්නා ලදී.

| | රු | රු |
|---|---|---|
| ලද ගෙවල් කුලී | | 90,000 |
| ලද ස්ථාවර තැන්පත් පොලි | | 25,000 |

අතිරේක තොරතුරු

1) 2016 වර්ෂය සඳහා මාසිකව ලැබිය යුතු ගෙවල් කුලිය රු.18,000 කි.

2) 2016.12.31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.12,000 කි.

අවශ්‍ය වන්නේ,

1) ඉහත ගැලපිලි ගැලපීමට අදාල ජර්නල් සටහන් දක්වන්න.

2) 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුමේ හා 2016.12.31 දිනට ශේෂ පත්‍ර උද්ධෘතයන් පිළියෙළ කරන්න.

**<u>04. ඉදිරියට ගෙවූ වියදම් ගැලපීම.</u>**

ගිණුම් කලපරිච්ඡේදය අවසාන වන දිනය වන විට ගෙවා ඇති වියදම් තුල කලපරිච්ඡේදයට අදාල නොමැති කාලය තුල වැඩිපුර ගෙවූ වියදම් ඇතුලත් නම් එම වියදම් පහත පරිදි ගැලපිය යුතුය.

**ඉදිරියට ගෙවූ වියදම් ගිණුම හර**

**අදාල වියදම් ගිණුම බැර**

මෙහිදී "ඉදිරියට ගෙවූ වියදම් ගිණුම හර" යන්න ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙසත් "අදාල වියදම් ගිණුම බැර" යන්න අදාල වියදම් ගිණුමින් අඩු කිරීමත් ලාභාලාභ ගිණුමේ හරටත් සටහන් කළ යුතුය.

- 2016.12.31 දිනට රමී ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමින් පහත දෑ උපුටා ගන්න ලදී.

| | රු | රු |
|---|---|---|
| රක්ෂණය | 38,000 | |
| දුරකථන ගාස්තු | 25,000 | |

අතිරේක තොරතුරු

1) 2016 වර්ෂය සඳහා මාසිකව ගෙවිය යුතු රක්ෂණ මුදල රු.3,000 කි.

2) 2016.12.31 දිනට ඉදිරියට දුරකථන ගාස්තුව රු. 1,500 කි.

අවශ්‍ය වන්නේ,

1) ඉහත ගැලපිලි ගැලපීමට අදාල ජර්නල් සටහන් දක්වන්න.

2) 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුමේ හා 2016.12.31 දිනට ශේෂ පත්‍ර උද්ධෘතයන් පිළියෙළ කරන්න.

- 2016.12.31 දිනට දෙව් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමින් පහත දෑ උපුටා ගන්න ලදී.

| | රු | රු |
|---|---|---|
| ගෙනයාමේ කුලී | | |
| වරිපනම් | | |
| වැටුප් හා වේතන | | |

අතිරේක තොරතුරු

1) 2016 වර්ෂය සඳහා මාසිකව ගෙවියයුතු වරිපනම් මුදල රු.4,000 කි.

2) 2016 වර්ෂයේදී වැටුප් හා වේතන ගෙවන ලද්දේ 2017 ජනවාරි මාසයත් ඇතුලත්ව ය. රු.3,000 කි.

3) 2012.12.31 දිනට ගෙවිය යුතු ගෙන යාමේ කුලිය රු. 8,000 කි.

අවශ්‍ය වන්නේ,

1) ඉහත ගැලපිලි ගැලපීමට අදාල ජර්නල් සටහන් දක්වන්න.

2) 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුමේ හා 2016.12.31

දිනට ශේෂ පත්‍ර උදෘතයන් පිළියෙළ කරන්න.

**05. <u>කලින් ලැබූ අදායම් ගැලපීම</u>**.

කලපරිච්චේදය තුල ලැබිය යුතු අදායම් ප්‍රමාණයට වඩා වැඩි අදායම් ප්‍රමාණයක් කලච්චේදය තුල ලැබී ඇත්නම් එලෙස වැඩිපුර ලැබී ඇති අදායම් පහත පරිදි ගැලපිය යුතුය.

**අදාල අදායම් ගිණුම හර**

**කලින් ලැබූ අදායම් ගිණුම බැර**

මෙහි දී "අදාල අදායම් ගිණුම හර" යන්න අදාල අදායම් ගිණුමෙන් අඩු වී ලාභාලාභ ගිණුම බැර වන අතර "කලින් ලැබූ අදායම් ගිණුම බැර" යන්න ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ සටහන් කරනු ලැබේ.

- 2016.12.31 දිනට වතු ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමින් පහත දෑ උපුටා ගන්න ලදී.

| | රු. | රු. |
|---|---|---|
| ලද ගෙවල් කුලී | | |
| ලද කොමිස් | | |
| ලද කඩකුලි | | |

අතිරේක තොරතුරු

1) 2016 වර්ෂය සඳහා මාසිකව ලැබිය යුතු ගෙවල් කුලිය රු.6,000 කි.

2) 2016.12.31 දිනට කලින් ලැබූ කොමිස් මුදල රු.3,000 කි.

3) 2016 වර්ෂයේ 2017 ජනවාරි මාසයට අදාල කඩකුලී සමග ලැබී ඇත.

අවශ්‍ය වන්නේ,

1) ඉහත ගැලපිලි ගැලපීමට අදාල ජර්නල් සටහන් දක්වන්න.

2) 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුමේ හා 2016.12.31 දිනට ශේෂ පත්‍ර උදෘතයන් පිළියෙළ කරන්න.

❖ ZA සමාගමේ 2016.03.31 දිනට ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 650,000 | |
| මෝටර් රථ | 230,000 | |
| ලී බඩු | 25,000 | |
| ණයගැතියෝ | 12,500 | |
| ණයහිමියෝ | | 2,000 |
| විකුණුම් | | 458,000 |
| 2016.04.01 තොගය | 12,000 | |
| ආපසු එවුම් | 6,000 | |
| ගැනුම් | 295,000 | |
| ගෙන ඒමේ කුලී | 2,500 | |
| විගණන ගාස්තු | 14,500 | |
| ආයෝජන | 56,000 | |
| විකුණුම් කොමිස් | | 3,000 |
| ණය පොලී | 650 | |
| රක්ෂණ | 2,500 | |
| විදුලිය | 1,200 | |
| සේවක භාරකාර අරමුදල් වියදම් | 800 | |
| ලැබූ කඩ කුලී | | 3,000 |
| මුදල් වංචා | 6,900 | |
| ගැනිලි | 25,800 | |
| ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | 800 | |
| දුන්වට්ටම් | 2,500 | |
| බැංකු ශේෂය | 36,500 | |
| ගෙනයාමේ වියදම් | 2,500 | |
| ලි බඩු අලුත්වැඩියා වියදම් | 5,000 | |
| වැටුප් හා වේතන | 45,000 | |
| කීර්තිනාමය | 12,000 | |
| ගෙවල් කුලී | 12,500 | |
| වරිපනම් | 6,000 | |
| විවිධ වියදම් | 2,000 | |
| සේවක අර්ථසාධක අරමුදල් වියදම් | 2,000 | |
| දුරකථන ගාස්තු | 29,000 | |
| ආපසු යැවුම් | | 2,500 |
| ණය | | 6,500 |

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 1,022,150 |
| | 1,497,150 | 1,497,150 |

අතිරේක තොරතුරු

01) 2016.12.31 දිනට ව්‍යාපාරයේ ඉතිරි වී ඇති මුළු නිමි තොගයේ වටිනාකම රු.4,500 කි.

02) මාසිකව ගෙවිය යුතු ගෙවල් කුලිය රු.1,500 කි.

03) කලින් ගෙවූ වරිපනම් මුදල රු. 500 කි.

04) ලැබිය යුතු කඩකුලි මුදල මසකට රු.400 කි.

05) කලින් ලැබූ විකුණුම් කොමිස් මුදල රු. 1,000 කි.

06) රක්ෂණ ගාස්තු ගෙවා ඇත්තේ මාස 10 කට පමණි.

ඔබ විසින්,

01) ගැලපුම් සටහන් කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්

02) 2016.12.31 දිනෙන් අවසන් සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

03) 2016.12.31 දිනට ශේෂ පත්‍රය පිළියෙළ කරන්න.